සුනේත්‍රා මහාදේවී පිරිවෙන
පැපිලියාන,
බොරලැස්ගමුව.
2026.02.19

ගරු ජනාධිපති,
අනුර කුමාර දිසානායක මැතිතුමා,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ

ගරු ජනාධිපතිතුමනි,

## පළාත් සභා මැතිවරණය පැවැත්වීමෙන් පසුව දෙමළ ඊළාම් බෙදුම්වාදීන්ගේ මාර්ග සිතියම අභියස ආණ්ඩුව සහ මහජනයා මුහුණ දෙන අභියෝගය පිළිබඳව (මහජන සංදේශය)

**පූර්විකාව:**

ඔබතුමා ඉතා හොඳින්ම දන්නා පරිදි, ජාතික බලවේග ලෙස අප දීර්ඝ කාලයක් ශ්‍රී ලංකාවේ බෙදුම්වාදීන්ගේ මහා උපාය මාර්ගය සහ කාලානුරූපව ඒ තුළ තෝරනු ලබන උපක්‍රමවලට අදාළ ජාත්‍යන්තර සහ දේශීය තත්ත්වයන් පිළිබඳව පර්යේෂණාත්මකව අධ්‍යයනය කරන පිරිසකි. එමෙන්ම, එම ක්‍රියාවලිය තුළ විවිධ වකවානුවල බෙදුම්වාදී සටන් උපක්‍රම පරාජය කිරීම සඳහා ඔබතුමා ඇතුළු ජනතා විමුක්ති පෙරමුණේ අතීත නායකයන් සමග මතවාදීව සහ ක්‍රියාන්විතයන් තුළ සමීපව කටයුතු කළ බව ඔබතුමා පිළිගන්නවා ඇත.

ජනතා විමුක්ති පෙරමුණේ අතීත නායකයින් විසින් 1987 ඉන්දු - ලංකා ගිවිසුම සහ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය මෙන්ම, 2002 සටන් විරාම ගිවිසුම තුළ තාවකාලික ආණ්ඩු යෝජනාව සහ 2005 සුනාමි සහන මණ්ඩල යෝජනාව පරාජය කිරීම සඳහා ඉටු කළ මහා භූමිකාව ශ්‍රී ලංකා ඉතිහාසයේ තීරණාත්මක මඟ සලකුණු බව අවිවාදාත්මකව පිළිගැනීමට සිදුවේ. එසේ නොවන තත්ත්වයක් යටතේ, අද වන විට අපගේ ආදරණීය මාතෘ භූමිය දෙකඩ වී සුඩානයට අත්වූ අවාසනාවන්ත ඉරණමට ගොදුරු වන බව අපි තරයේ විශ්වාස කරමු.

ඔබතුමාගේ පාලන කාලය තුළ ඊට පෙර සිටි පාලකයන් විසින් නිර්මාණය කළ අර්බුද මෙන්ම, ගෝලීයව වර්ධනය වන භූ දේශපාලන ගැටුම්කාරී තත්ත්වයන් තුළ පැන නගින අභියෝගවලට අමතරව, නව වටයකින් දිග හැරෙන බෙදුම්වාදී මාර්ග සිතියම ඔස්සේ නිර්මාණය වීමට නියමිත තීරණාත්මක අභියෝගවලට ඔබතුමාට මුහුණ දීමට සිදුවනු ඇත. එම ක්‍රියාවලිය තුළ විශේෂයෙන්ම දෙමළ ඩයස්පෝරාව ප්‍රමුඛ බෙදුම්වාදී බලවේග, නව තිර පිටපතක් අනුව ඉතා සූක්ෂ්ම මනෝ විද්‍යාත්මක යුද උපක්‍රම තෝරමින් සිටින බව අපගේ දේශපාලන නිරීක්ෂණය සහ කියවා ගැනීම බවද සඳහන් කළ යුතුය.

එම ක්‍රියාවලිය, එළඹෙන පළාත් සභා මැතිවරණය පැවැත්වීමෙන් පසුව ඉතා කෙටි කලකදී ආරම්භ වන බව අපගේ තර්කානුකූල පිළිගැනීම වේ. ඉන්දියානු විදේශ අමාත්‍යවරයා විසින් එම මැතිවරණය කඩිනමින් පැවැත්වීම සඳහා ආණ්ඩුවට බලපෑම් කළ යුතු බවට සුළු ජන ජාතිවාදී සහ බෙදුම්වාදී පක්ෂවලට උපදෙස් දුන් බව පසුගිය දිනවල පුවත්පත් මගින් වාර්තා විය. ඉන්පසුව වෙනත් නිල නොවන වාර්තා මගින් දැන ගැනීමට ලැබෙන්නේ පවතින ආපදා තත්ත්වය තුළ මැතිවරණය කල් දමා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ඉන්දියානු නායකයන් සමග සාකච්ඡා කරන බවකි. නමුත් එය අනන්තය දක්වා කල් දැමිය නොහැකි බව ඉතා පැහැදිලිය. ඊට හේතුව ලෙස අප දකින්නේ, බෙදුම්වාදී බලවේග ඒ සඳහා එකඟ නොවීමය. ඊට අමතරව පසුගිය තෛපොංගල් උත්සව දිනයේදී ඔබතුමා විසින් යාපනයේදී සිදුකළ ප්‍රකාශය අනුව පැහැදිලි වන්නේ

ජාතිවාදය සහ බෙදුම්වාදී බලවේග සතුටු කිරීම සඳහා රටේ බහුතර ජනයාගේ අපේක්ෂාවන් නොසලකා කටයුතු කිරීමට ඔබතුමා සූදානම් බවය. කෙසේ වෙතත් ඉන්දියාව විසින් මේ වන විට අත්සන් කර ඇති ගිවිසුම් සහ අනාගතයේ දී අත්සන් කිරීමට නියමිත බණිජ සම්පත් ගිවිසුම සහ එට්කා ගිවිසුම ආදිය මගින් සිදු කිරීමට නියමිත අත්පත් කර ගැනීම් සම්පූර්ණ කර ගැනීම සඳහා යම් කෙටි කාලයක් ආණ්ඩුවට ලබාදීමට ඉඩ ඇති බව අපි පිළිගනිමු.

ඒ අනුව එම තත්ත්වයට මුහුණදීම සඳහා බෙදුම්වාදී මාර්ග සිතියමේ අවසන් සැතපුම් කිහිපය ඔවුන් විසින් තරණය කරන ආකාරය පිළිබඳව අපගේ අධ්‍යයනවලට අනුව ඔබ තුමාට කරුණු දැක්වීම සහ එම අභියෝගය ජය ගැනීම සඳහා  මග පෙන්වීම මුල්කරගෙන මෙම ලිපිය ඔබතුමා වෙත යොමු කරමු.

## පසුබිම සහ පැහැදිලි කිරීම:

1. අධිරාජ්‍යවාදී භූ දේශපාලන උවමනාවන්ට අනුව ලෝකයේ මේ වන විට බෙදා වෙන්කර ඇති රටවල් 26ක් පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ඒ කිසිදු රටක් අවසාන වශයෙන් යුද්ධයක් තුළ දේශසීමා සලකුණු කිරීමෙන් බෙදා වෙන්කර නොමැති බවය. එහිදී යුද්ධය යොදාගනු ලබන්නේ ඊනියා දේශපාලන විසඳුමක් ලෙස ව්‍යවස්ථාව මගින් හෝ ජාත්‍යන්තර ගිවිසුමක් මගින් හෝ අනාගතයේ බෙදාවෙන් කරනු ලබන රාජ්‍යයේ දේශසීමා සලකුණු කිරීම මෙන්ම, ජාත්‍යන්තර මැදිහත් වීමක් මගින් බෙදා වෙන්කිරීම සහ එම නව රාජ්‍යය ජාත්‍යන්තරව පිළිගැනීම සඳහා අවස්ථාව නිර්මාණය කර ගැනීමටය.

2. ජාත්‍යන්තර මැදිහත්වීම මත අවසාන වශයෙන් 2011 දී සුඩානය බෙදා වෙන් කිරීම සඳහා යොදාගනු ලබන්නේ ජාත්‍යන්තර ගිවිසුමකි. ශ්‍රී ලංකාවට අදාළව ගත් විට 1987 දී ද්විපාර්ශ්වික ගිවිසුමක් තුළින් බලපෑම් කිරීම මගින් ව්‍යවස්ථා සංශෝධනයක් හරහා බෙදා වෙන් කිරීමට නියමිත රාජ්‍යයේ දේශ සීමා සලකුණු කළ අතර, ඉන්පසුව 2002 දී ජාත්‍යන්තර ගිවිසුමක් මගින් තාවකාලික ආණ්ඩුවක් නමින් බෙදා වෙන් කෙරෙන රාජ්‍යය නිර්මාණය කිර්ම සඳහා දෙමුහුන් උපාය මාර්ගයක් යොදා ගැනීමට උත්සාහ කරනු ලැබීය. ඊට පසුව 2005 දී සුනාමි ආපදාව යොදාගනිමින් ජාත්‍යන්තර මැදිහත්වීම මත සුනාමි සහන මණ්ඩලය නමින් උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල අන්තර්කාලීන පාලන ඒකකයක් පිහිටුවීමට උත්සාහ කරනු ලැබීය.

3. එම වකවානුවේදී එදා පැවති ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ජාතික බලවේග සහ රටට ආදරය කරන සෙසු ජනතාවගේ දැඩි විරෝධය නිසා එම උත්සාහයන් පරාජය කිරීමට හැකි විය. (එදා 1987 දී පූර්ණ ෆෙඩරල් රාජ්‍යයක් නිර්මාණය කිරීමට නොහැකි වන්නේ එම ප්‍රබල විරෝධතා නිසා ජනමත විචාරණයක් මගින් අදාළ සංශෝධන සම්මත කරගැනීමට හැකියාවක් නොතිබුණු බැවිනි. ඒ අනුව පූර්ණ ෆෙඩරල් රාජ්‍යයක අංග ලක්ෂණ ව්‍යවස්ථාවට ඇතුළත් කළ ද ඒවා ක්‍රියාත්මක කිරීම වැළැක්වීම සඳහා ව්‍යවස්ථාමය බාධක ප්‍රමාණයක් පැනවීමට සිදුවිය.)

4. ඒ අනුව 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම යනුවෙන් සටන් පාඨයක් බෙදුම්වාදීන් විසින් නිර්මාණය කරනු ලබන්නේ එම ව්‍යවස්ථාමය බාධක ව්‍යවස්ථා සංශෝධනයක් මගින් හෝ විධායක ජනාධිපතිවරයා සතු බලතල යටතේ පරිපාලනමය වශයෙන් හෝ ඉවත් කිරීම මුල්කරගෙන ආණ්ඩුවට බලපෑම් කිරීම සඳහාය. (පසුගිය ජනාධිපතිවරු 8 දෙනෙකු අතරින් යම් අයෙකුට ඒ සඳහා උවමනාව තිබුණ ද එය ඉටුකර හැගීමට හොහැකි වන්නේ ඊට එරෙහිව අතීතයේ සිදුකළ මහා කැපකිරීම් නිසා බහුතර සමාජයේ මුල් බැසගෙන පවතින බෙදුම්වාදී විරෝධී මතවාද නිසා බව ඉතා පැහැදිලිය)

5. ව්‍යවස්ථා සංශෝධනයක් මගින් අදාළ ව්‍යවස්ථාමය බාධක ඉවත් කළහොත් විධායක ජනාධිපතිවරයා කුමන ස්ථාවරයක සිටිය ද, බෙදුම්වාදී මාර්ග සිතියම පියවරෙන් පියවර දිගහැරෙන විට ඔහුට අසරණව බලාසිටීමට සිදුවේ. විධායක ජනාධිපතිවරයා විසින්ම පරිපාලන වශයෙන් එම බාධක ඉවත් කිරීම මගින් පාර්ලිමේන්තුව අසරණ කිරීමේ හැකියාව ලැබේ. එසේ වුවද, මාර්ග සිතියමේ තීරණාත්මක සැතපුම පසුකළ පසුව, විධායක ජනාධිපතිවරයා සතුව කුමන අත්තනෝමතික බලතල තිබුන ද ජාත්‍යන්තර මැදිහත්වීම තුළ ඔහුට අසරණව බලා සිටීමට සිදු වේ.

6. ව්‍යවස්ථා සංශෝධනයක් මගින් 13ට එරෙහිව පවතින බාධක ඉවත් කිරීමට හැකිවුවහොත් එය බෙදුම්වාදීන්ගේ ප්‍රබල ජයග්‍රහණයක් වුවද, ඔවුන් කිසිසේත්ම ජනමත විචාරණයක් අවශ්‍ය වන නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම මගින් තම මූලෝපායික අවශ්‍යතාව ඉටුකර ගැනීමට සැලසුම් නොකරන බව ඉතා පැහැදිලිය. එනම්, බහුතර සිංහල ජනතාවගේ අනුකම්පාව මත ඊළාම් රාජ්‍යය නිර්මාණය කිරීමේ සිහිනයක් තුළ බෙදුම්වාදී න්‍යායාචාර්යවරුන් කටයුතු නොකරන බව ඉතා පැහැදිලිය.

7. ඒ අනුව ඒකීය වචනය වෙනස් කිරීම හෝ බුද්ධාගමට හිමි ප්‍රමුඛස්ථානය වෙනස් කිරීම ආදිය ඇතුළත් වන නව ව්‍යවස්ථාවක් පිළිබඳ සංවාදය බෙදුම්වාදීන් විසින් ප්‍රචලිත කරනු ලබන්නේ මානසික යුද උපක්‍රමයක් ලෙස රටේ බහුතර ජනතාව "ගොනාට ඇන්දවීම" සඳහා බව ඉතා පැහැදිලිය. ඒ මගින් මහජනයා දුර තිබෙන අනතුර දෙස බලා සිටින අතරතුර, අනතුරක් ලෙස නොපෙනෙන ආකාරයට විධායක ජනාධිපති බලතල මගින් 13 වැනි සංශෝධනය ඉතා සූක්ෂ්ම ආකාරයට පරිපාලන වශයෙන් බලාත්මක කිරීම සඳහා අවස්ථාව නිර්මාණය වේ. (පවතින ව්‍යවස්ථාවේ ඒකීය වචනය එසේම තිබියදී ඒකීය අන්තයක් සේම ඒකීය භාවය අභියෝගයට ලක්වන ෆෙඩරල් අන්තයක් තිබිය හැකි බව "චන්ද්‍රසෝම එදිරිව සේනාධිරාජා" නඩු තීන්දුව මගින් පැහැදිලි වේ.)

8. පරිපාලන වශයෙන් 13 බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නේ පළාත් සභා මැතිවරණය පවත්වා මහ ඇමැතිවරයාට යටත්වන ආණ්ඩුකාරවරයෙකු පත්කිරීම පමණි. එවිට පොලිස්, ඉඩම්, මහ ඇමති අරමුදල් සහ පළාත් පුරාවිද්‍යා අධිකාරිය ආදී වශයෙන් බරපතළ බලතල ලබෙන ප්‍රඥප්ති ආණ්ඩුකාරවරයාගේ විරෝධයක් නොමැතිව සම්මත කිරීම සඳහා අවස්ථාව නිර්මාණය වේ. (මහජනයා නොමඟ යැවීම සඳහා පොලිස් ප්‍රඥප්තිය, පළාත් මහජන ආරක්ෂක ප්‍රඥප්තිය සහ ඉඩම් ප්‍රඥප්තිය, කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය ලෙස ද ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.)

9. එසේ ප්‍රඥප්ති එකක් පිටුපස එකක් වශයෙන් සම්මත කිරීමේ දී ඒවා රටේ ව්‍යවස්ථාවට සහ නීතියට පටහැනි බවට නම් කොට ආණ්ඩුකාරවරයා විසින් එම ප්‍රඥප්ති ආපසු හරවා යැවීමට කටයුතු නොකරන තත්ත්වයක් යටතේ හා ඊට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීමට ජනාධිපතිවරයා වෙත යොමු නොකරන තත්ත්වයක් යටතේ, විශේෂයෙන්ම මානසික බාධක හේතුකොට ගෙන ජනාධිපතිවරයා ඊට මැදිහත් නොවන තත්ත්වයක් යටතේ, අනාගතයේ දී ගැටුම් ඇතිවන ආකාරයට එම ප්‍රඥප්ති සියල්ල ඉතා පහසුවෙන් සම්මත කිරීමේ හැකියාව ලැබේ. (මධ්‍යම ආණ්ඩුවේ පනත් කෙටුම්පතකට අදාළව ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීමට මහජනයාට අයිතිය ලබාදී තිබුන ද, 13 වැනි සංශෝධනය මගින් පරමාධිපත්‍ය බලය බෙදී යන ආකාරයට බලය බෙදා ඇති තත්ත්වයක් යටතේ පවා පළාත් බලතල ලැයිස්තුවට අදාළ ප්‍රඥප්තියක් පිළිබඳ ප්‍රශ්න කිරීමේ අයිතිය ඉතා සූක්ෂ්ම ලෙස මහජනයාට අහිමිකර ඇත. නමුත් ප්‍රඥප්තියක් සම්මත වූ පසු මධ්‍යම ආණ්ඩුවේ පනතකට හිමිවන ව්‍යවස්ථාමය තත්ත්වය එවැනි ප්‍රඥප්තියකට ද හිමිවන බැවින් ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමේ බලයක් අධිකරණයට හිමිවන්නේ නැත.)

10. නමුත් ඉන්දියාවේ ව්‍යවස්ථාව අනුව ප්‍රඥප්තියක් සම්මත කළ පසුව එය අත්හිටුවීමේ බලය ජනාධිපතිවරයා සතු වේ. ඒ අනුව පැහැදිලි වන්නේ 13 වැනි සංශෝධනය යනු ඉන්දියානු

ව්‍යවස්ථාවටත් වඩා බෙදුම්වාදයට රට ගොදුරු කරන ව්‍යවස්ථා සංශෝධනයක් බවය. (එහිදී 13 වැනි සංශෝධනයට අදාළ පනත් කෙටුම්පත සකස් කරනු ලබන්නේ ඉන්දියානු නිලධාරීන් විසින් බව එළිදරව් වීම ද විශේෂ තත්ත්වයකි)

11. ඉතා බරපතළ බලතල පළාත් සභාවලට ලැබෙන ප්‍රඥප්ති සම්මත කිරීමෙන් පසුව ඒවා ක්‍රියාත්මක කිරීමේ දී මධ්‍යම ආණ්ඩුව සමග ගැටුම් ඇතිකර ගැනීමේ අවස්ථාව නිර්මාණය වන අතර, ඒවා මහජන සහභාගීත්වය සහිතව අවිහිංසාවාදී ස්වරූපයෙන් සිදු කෙරෙන බව බෙදුම්වාදී න්‍යායාචාර්යවරුන් විසින්ම පිළිගෙන ඇත. එම ගැටුම් තුළ ජාත්‍යන්තර මැදිහත්වීමකට අවස්ථාව නිර්මාණය වේ. ජාත්‍යන්තර මැදිහත්වීම තුළ බලසම්පන්න විධායක ජනාධිපතිවරයාට අසරණව බලා සිටීමට සිදුවන බව ජාත්‍යන්තර අත්දැකීම් අනුව පැහැදිලි වේ. උදාහරණයක් ලෙස, කොසෝවෝ බෙදා වෙන් කිරීමේ දී බෙදුම්වාදීන් විසින්ම ඔවුන්ගේ අනන්‍යතාව හඳුනාගත නොහැකි ආකාරයට, එනම් නීත්‍යනුකූල ආරක්ෂක හමුදා විසින් සිදු කළ බව තහවුරු වන ආකාරයට නිරායුධ, සිවිල් ජනයා 800ක් ඝාතනය කිරීමෙන් පසුව ජාත්‍යන්තර මැදිහත්වීමකට අවස්ථාව නිර්මාණය විය. (ශ්‍රී ලංකාවේ දී එවැනි තත්ත්වයක් නිර්මාණය කළහොත් දැන් පවතින තත්ත්වය යටතේ අදාළ මරණ ප්‍රමාණය කොසෝවෝ ප්‍රමාණයෙන් 1%ක් වුවද සෑහෙන බව වටහා ගැනීම අමාරු නැත.)

12. දිවංගත ආර්. සම්බන්ධන් මහතා 2012 දී දෙමළ රාජ්‍ය පක්ෂයේ (ITAK) මහා සමුළුව අමතමින් මඩකලපුවේ දී සඳහන් කරන්නේ තමා ඊළාම් අරමුණ අතහැර නැති බව සහ ඊට ළඟාවන උපාය මාර්ගය පමණක් වෙනස් කරන බවය. එනම්, යුද්ධය වෙනුවට අවිහිංසාවාදී, ගාන්ධිවාදී මහජන සටන් යොදාගන්නා බවත් එහිදී ජාත්‍යන්තර ප්‍රජාවට මැදිහත් වන ලෙස ආරාධනා කරන බවත් ය. නමුත් ඉහත සඳහන් කළ ආකාරයට පරමාධිපත්‍යයේ බලය බෙදී යන ආකාරයට බලතල බෙදා ඇති බව තහවුරු වන තුරු, එනම් අදාළ මූලික ප්‍රඥප්ති සම්මත වී අවසන් වන තුරු ඊනියා සාමකාමී කාලය පවතින බව සඳහන් නොකිරීමට ඔහු පරෙස්සම් විය.

13. එම ක්‍රියාවලිය තුළ, 2015 සිට ජාත්‍යන්තර මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා මගින් බලපෑම් කළ ආකාරයට, සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසන්ධාන කොමිසම පිහිටුවීමට අදාළ නීතිය සම්මත කළහොත් ඒ මගින් බෙදුම්වාදී මාර්ග සිතියමේ අවශ්‍යතා දෙකක් ඉටුකර ගැනීමට හැකියාව ලැබේ. ඒ අතරින් පළමුවැන්න ආරක්ෂක හමුදාවලට යුද අපරාධ චෝදනා එල්ල කරමින් හමුදා නිලධාරීන් දුර්වල කිරීම සහ දුර්මුඛ කිරීමය. දෙවැන්න, රට තුළ සිටිමින් ජාත්‍යන්තර මැදිහත්වීම සිදු කිරීම සඳහා අවස්ථාව නිර්මාණය කර ගැනීමය.(ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ 230 පිටුවේ සඳහන් ආකාරයට සහ ජාත්‍යන්තර මානව හිමිකම් කවුන්සිලයේ 60 වන සැසියේදී ශ්‍රී ලංකාවේ ආණ්ඩුව පොරොන්දු වූ ආකාරයට දැනට ගැසට් කර ඇති පනත් කෙටුම්පත සම්මත කළහොත් බෙදුම්වාදී මාර්ග සිතියම ඔස්සේ ඉදිරියට ගමන් කිරීම සඳහා බලවත් පිටිවහලක් ලැබේ. ඊට අමතරව වර්තමාන අධිකරණ අමාත්‍යවරයා විසින් සඳහන් කර ඇති ආකාරයට, ආණ්ඩුව විසින් අභිචෝදක කාර්යාල පනත සම්මත කළහොත් රණවිරුවන්ට එරෙහිව දේශීයව සහ විදේශීය රටවලදී නඩු පැවරීමේ ක්‍රියාවලිය ආපසු හැරවිය නොහැකි ලෙස ඉදිරියට ගමන් කරනු ඇත. ඒ මගින් ආරක්ෂක හමුදාවලට මානසික බාධක පැනවීම යනු බෙදුම්වාදී මාර්ග සිතියමට අදාළ පූර්ණ කොන්දේසියක් බව ඉතා පැහැදිලිය.)

14. ඕස්ට්‍රේලියාව ආසන්න සාගර ප්‍රදේශයේ ඛනිජ සම්පත් ගවේෂණය පිළිබඳව ගිවිසුම් ගත වීම මුල්කර ගෙන ඒ වන විට බෙදී වෙන්වී තිබූ නැගෙනහිර ටිමෝරයට අදාළව ජාත්‍යන්තර අධිකරණයේ විභාගයට ලක් වූ පෘතුගාලය එදිරිව ඕස්ට්‍රේලියාව නඩුවේ තීන්දුව අනුව, පරමාධිපත්‍ය බෙදීයන ආකාරයට, එනම් පළාතේ ජනතාවට ලබා දී ඇති යම් බලතලවලට අදාළව නීති පැනවීමේ බලය ලබාදී ඇති තත්ත්වයක් තුළ, මධ්‍යම රජය විසින් එම බලය ක්‍රියාත්මක කිරීමට ඉඩ ලබා නොදෙන්නේ නම් එම ජනතාවට බෙදී වෙන්වීමේ අයිතිය ලැබේ. ඊට අමතරව එම ජනතාව සමූල ඝාතන ක්‍රියාවලියකට ගොදුරු වී ඇත්නම් එම අයිතිය තවදුරටත් තහවුරු වේ. (කැනේඩියානු ඩයස්පෝරා

සංවිධාන විසින් සමුල ඝාතන සති පැවැත්වීම මගින් ඊට අදාළව ජාත්‍යන්තර මතයක් නිර්මාණය කිරීමේ උවමනාව ඒ මගින් තහවුරු වේ.) ඒ අනුව ඛනිජ සම්පත්, පළාත් ලැයිස්තුවට ඇතුළත් වන බැවින් ඒවා ගවේෂණයට අදාළව පළාත් ආණ්ඩුව විසින් ප්‍රඥප්තියක් සම්මත කිරීමෙන් පසුව නොර්වේ හෝ ඉන්දියාව වැනි රටක් සමඟ ගිවිසුම්ගත වීමට ගනු ලබන උත්සාහයකට මධ්‍යම රජය විරුද්ධ වුවහොත් එමගින් ජාත්‍යන්තර අධිකරණයේ මතය විමසීමට අවස්ථාව නිර්මාණය වේ.

15. ඒ අතර, මහා පින්තූරය තේරුම් ගැනීමේ දී දැනුම්වත්ව හෝ අනවබෝධය නිසා තත්ත්වයේ බරපතළකම අවතක්සේරු කිරීම සඳහා විවිධ අතාර්කික මතවාද ප්‍රචලිත කෙරෙන බවක් ද දක්නට ඇත. ඒ අතරින් පළමු වැන්න, ශ්‍රී ලංකාව බෙදා වෙන් කිරීම මගින් ඉන්දියාවේ බෙදුම්වාදය ප්‍රචලිත කෙරෙන බැවින් ඉන්දියාව ඊට එරෙහිවන  බවට පළ කරනු ලබන වැරදි මතවාදයයි. ඊට අමතරව මෑත කාලීන තමිල්නාඩුවේ දෙමළ ජාතිවාදය හිස එස වීම තුළ සහ අගමැති නරේන්ද්‍ර මෝඩි එම තත්ත්වය පාලනය කිරීම සඳහා ඊට එරෙහිව පියවර ගැනීම තුළ ශ්‍රී ලංකාවට ආරක්ෂාවක් ලැබෙන බවට ද තවත් මතවාදයක් ප්‍රචලිත වේ. නමුත් 1932 සිට, 'රෝ' සංවිධානයට මඟ පෙන්වන "සර්ධාර් පණික්කාර්" න්‍යාය අනුව 'අඛණ්ඩ භාරත්' හෙවත් මහා භාරතය නිර්මාණය කිරීම සඳහා අසල්වැසි රටවල් ගිවිසුම් මගින් අර්ධ යටත්විජිත ලෙස ඈඳා ගත යුතුය. ඒ අනුව ආර්ථික ඒකාබද්ධකරණ ක්‍රියාවලිය මගින් ශ්‍රී ලංකාව 29 වැනි ප්‍රාන්තය බවට පත්කර ගැනීම සහ තවදුරටත් දුර්වල කර පවත්වාගෙන යාම සඳහා 30 වැනි ප්‍රාන්තය හෙවත් ඊළාම් රාජ්‍යය නිර්මාණය කර තමිල්නාඩුවට ඈඳා ගැනීම මගින් තමිල්නාඩුවේ දෙමළ ජාතිවාදයට අල්ලස් ලබා දී ඔවුන් දමනය කිරීමේ උපාය මාර්ගය ඉන්දියාව විසින් තෝරන බවට පැහැදිලි සාක්ෂි දැක්විය හැකිය.

**ගොඩනැගෙමින් පවතින තත්ත්වය:**

1. ශ්‍රී ලංකාවේ බෙදුම්වාදී මාර්ග සිතියම් සහ ජාත්‍යන්තර බෙදුම්වාදී අත්දැකීම් විශ්ලේෂණය කිරීමේ දී, අවසන් සැතපුම දක්වා ළඟාවීම සඳහා මූලික කොන්දේසි හතරක් සපුරා ගැනීම අවශ්‍ය වන බව පැහැදිලි වේ. ඒ අතරින් පළමු වැන්න ආණ්ඩුවේ සහ බහුතර ජනතාව අතර පවතින 13 වැනි සංශෝධනයට එරෙහිව ගොඩනැගී ඇති මානසික බාධක ඉවත් කිරීම සහ බෙදුම්වාදීන්ගේ ක්‍රියාකාරකම්වලට විරුද්ධ වීමට එරෙහිව මානසික බාධක පැනවීමය. දෙවැන්න, සුළුතර වෙල්ලාල ප්‍රභූන් විසින් ප්‍රචලිත කරන දෙමළ ජාතිවාදය සහ බෙදුම්වාදය කුලහීන බහුතර පීඩිත ජනතාව මත පැටවීම සහ නව තත්ත්වයක් පිළිබඳ එම ජනතාව තුළ විශ්වාසය ගොඩනැගීමය. තුන්වැන්න, රණවිරු දඩයම් ක්‍රියාවලිය, විශේෂයෙන්ම ඊට අදාළ නව නීති සම්මත කිරීම මගින් ආරක්ෂක හමුදා දුර්වල කිරීම සහ දුර්මුඛ කිරීමය. ඒ මගින් ඊනියා ගෝල්ෆේස් අරගලයේ දී ආරක්ෂක හමුදාවලට නින්දා අපහාස කිරීමට මහජනතාව දීරිමත් කළ ආකාරයට උතුරු සහ නැගෙනහිර පළාත්වලින් හමුදා කඳවුරු ඉවත් කිරීමේ ක්‍රියාවලියට මහජනයා පෙළඹවීම සඳහා පදනම දැමීමය. හතර වැන්න, පළාත් සභා මැතිවරණය පවත්වා මහ ඇමැතිට යටත් වන ආණ්ඩුකාරවරයකු පත්කිරීමය.

2. ඉහත සඳහන් කළ චතුර්විධ උවමනාවන් සපුරා ගැනීමේ දී 13 ට එරෙහිව පවතින ආණ්ඩුවේ මානසික බාධක ඉවත් කිරීම සහ බෙදුම්වාදයට එරෙහිව පියවර ගැනීම වැළැක්වීම සඳහා ආණ්ඩුවට මානසික බාධක පැනවීම එකිනෙකට සමාන්තරව සිදු කිරීම සඳහා බහු විධ මානසික යුද්ධ උපක්‍රම බෙදුම්වාදීන් විසින් තෝරමින් සිටින බව පැහැදිලිව දැකගත හැකිය. ඩයස්පෝරාව විසින් ආණ්ඩුවට හොඳ හිත පෙන්වීම සහ අනාගතයේ දී ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ඩොලර් පොම්ප කරන බවට පොරොන්දු වීම් මෙන්ම, ඩයස්පෝරාව විසින් ආණ්ඩුවේ ජයග්‍රහණයට ප්‍රබල දායකත්වයක් සැපයූ බවට ව්‍යාජ මතයක් ගොඩනැගීම සහ බෙදුම්වාදී දේශපාලන නායකයින් ආණ්ඩුවට සහාය ලබා දෙන බවට ප්‍රසිද්ධ ප්‍රකාශ සිදුකිරීම ආදිය ඊට අයත් වේ.

3. උතුරේ බෙදුම්වාදී යුද්ධයෙන් පරාජයට පත් වී ජීවිත අහිමි කරගත් ත්‍රස්තවාදී නායකයාගේ පිංතූර ඇතුළුව, තහනම් සංවිධානයක ලාංඡන ප්‍රදර්ශනය කරමින් මහවිරු සති පැවැත්වීම මෙන්ම, ආණ්ඩුව ඊට එරෙහිව පියවර ගැනීම පිළිබඳව මානසික බාධක පනවා ගැනීම සහ එම ක්‍රියාවලිය පිළිබඳව වැරදි තොරතුරු ප්‍රචාරය කිරීම මගින් ජාතිවාදය ඇවිස්සීම වැළැක්වීමේ නාමයෙන් පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම තුළ එක් පැත්තකින් බහුතර ජනතාව බෙදුම්වාදයට එරෙහි වීම පිළිබඳව මානසික බාධක පනවා ගන්නා අතර, අනෙක් පැත්තෙන් වෙල්ලාල ප්‍රභූන් විසින් ප්‍රචලිත කරන දෙමළ ජාතිවාදය සහ බෙදුම්වාදය වැළඳ ගැනීම සඳහා හීන කුළ බහුතර පීඩිත ජනතාවට මානසික පෙළඹවීමක් ඇති වේ.

4. ආරක්ෂක තත්ත්වය පිළිබඳව මහජනයාට පිළිගත හැකි ඇගයීමකින් තොරව, උතුරේ හමුදා කඳවුරු ඉවත් කිරීම ආරම්භ කිරීම, පිරිස් බලය අඩු කිරීම සහ තවදුරටත් ආරක්ෂක හමුදා විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් නිදහස් කිරීම සඳහා පොරොන්දු වීම, ප්‍රධාන කඳවුරු අනාරක්ෂිත වන ලෙස වසා තිබූ මාර්ග විවෘත කිරීම සහ උපාය මාර්ගික වශයෙන් වැදගත් යම් කඳවුරු වසා දැමීම මෙන්ම, ගුවන් හමුදා පාලනය යටතේ පැවැති පළාලි සහ මඩකලපුව ගුවන්තොටුපොළ සිවිල් ගුවන්තොටුපොළ බවට පත්කිරීම, ආදී ක්‍රියාමාර්ග මගින් එක පැත්තකින් බෙදුම්වාදී බලවේග මානසිකව ශක්තිමත් වන අතර, අනෙක් පැත්තෙන් ආරක්ෂක හමුදා සහ බහුතර ජනතාව දුර්මුඛ වී ඔවුන් තුළ ව්‍යාජ ආරක්ෂාකාරී මනසක් ගොඩනැගෙනු ඇත. (මේ වන විට උතුරු සහ නැගෙනහිර පළාත්වලින් ආරක්ෂක හමුදා කඳවුරු 14ක් ඉවත් කිරීමට ආණ්ඩුව සැලසුම් කරන බවට සහ යාපනයේ පළාලි කඳවුර සහ මුලතිව් කඳවුර යන උපායමාර්ගික වශයෙන් ඉතා වැදගත් කඳවුරු ඊට අයත්වන බවට එළිදරව් වෙමින් ඇත.)

5. එසේම, ජාත්‍යන්තර මානව හිමිකම් කොමිසම හරහා සිදු කෙරෙන ආරක්ෂක හමුදාවලට එරෙහිව චෝදනා එල්ල කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගමන් කරන අතර, ඊට අනුව විශේෂිත සිදුවීම්වලට අදාළව ආරක්ෂක හමුදාවලට එරෙහිව පියවර ගන්නා බවට සහතික වීම මෙන්ම, යම් පරීක්ෂණ ආරම්භ කිරීම සහ සේවයේ නියුක්ත විශ්‍රාමික සහ ආබාධිත හමුදා සාමාජිකයන්ගේ යම් වරප්‍රසාද කප්පාදු කිරීම ආදියට අමතරව, ආරක්ෂක හමුදා පිරිස් බලය 50% කින් අඩු කිරීම සඳහා ජාත්‍යන්තර සංවිධානවලට පොරොන්දු ලබාදීම ආදිය මගින් ආරක්ෂක හමුදා දුර්වල කිරීම සහ දුර්මුඛ කිරීම යන බෙදුම්වාදී මාර්ග සිතියමේ පූර්ව කොන්දේසි ඉටුවීම තුළ බෙදුම්වාදීන්ගේ මානසික බාධක ඉවත්වන අතර, පොදු ජනතාවට නව මානසික බාධක පැනවේ. (එම ක්‍රියාවලියේ එක්තරා උච්ඡතම අවස්ථාවක් වන්නේ බෙදුම්වාදී ත්‍රස්තවාදියකුගේ සාක්ෂි මත පිහිටා නාවික හමුදාපතිවරයකුට නඩු පවරා රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීමය.)

6. ආණ්ඩුවේ යම් පාර්ශ්ව රටේ ජනතාව විසින් ජාතිවාදය ප්‍රතික්ෂේප කළ බවට අතිශයෝක්තියක් ගොඩනැගීම තුළ, එක් පැත්තකින් ප්‍රායෝගිකව දක්නට නොමැති 'සිංහල ජාතිවාදයක්' පිළිබඳව නිශේධනාත්මක ඉඟි පළවන අතර, අනෙක් පැත්තෙන් පසුගිය මැතිවරණවලදී උතුරේ පීඩිත ජනතාව අතරින් සැලකිය යුතු ප්‍රතිශතයක් දෙමළ ජාතිවාදය සහ එහි කූඨප්‍රාප්තිය වන බෙදුම්වාදය ප්‍රතික්ෂේප කරන ඡන්දයක් ප්‍රකාශ කළ බව යටපත් වේ. (උතුරු සහ නැගෙනහිර පළාත්වල මැතිවරණ දිස්ත්‍රික්ක 5ක ජනතාව විසින් බෙදුම්වාදයේ මුර දේවතාවා ලෙස පිළිගැනෙන ITAK පක්ෂයට 2019 පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඡන්ද 327,168ක් ලබා දෙන විට 2024 දී ලබාදෙන්නේ ඡන්ද 258,113 කි. ඊට අමතරව දෙමළ ජාතිවාදයේ සහ බෙදුම්වාදයේ ප්‍රකාශකයා ලෙස පෙනී සිටින එම්.ඒ. සුමන්තිරන්ට පාර්ලිමේන්තු අසුන අහිමිකර ඇත.)

7. නමුත් උතුරේ බහුතර ඡන්ද ලබාදීම මගින් ආණ්ඩුවේ ජයග්‍රහණයේ ප්‍රධාන සාධකය ලෙස ඩයස්පෝරාව සහ බෙදුම්වාදී බලවේග පෙනීසිටීම මගින් ආණ්ඩුවට මානසික බාධක පැනවීමට

අමතරව, දෙමළ ජාතිවාදය සහ බෙදුම්වාදය පිළිබඳව කතා නොකර ඊනියා සිංහල ජාතිවාදයක් පිළිබඳව අතිශයෝක්තියෙන් හුවා දැක්වීම සඳහා පෙළඹවීමක් ඇති කිරීමට බෙදුම්වාදීන් සමත් වී ඇත. එහෙත් සත්‍ය එය නොවන බව මැතිවරණ ප්‍රතිඵල අංක ගණිතමය වශයෙන් විශ්ලේෂණය කිරීමේ දී වුවද දැකගත හැකිය. ජනාධිපතිවරණයේ දී දෙමළ ඩයස්පෝරාවේ, ඉන්දියාවේ සහ බෙදුම්වාදී බලවේගවල තෝරාගැනීම වූයේ සජිත් ප්‍රේමදාස මහතා බව ඉතා පැහැදිලිය. ඒ මහතා එම බලවේගවලට බලපෑම් කළ හැකි වූ උතුරු සහ නැගෙනහිර දිස්ත්‍රික්ක 5න් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ඡන්ද 878,495 ලබා ගන්නා විට, අනුර දිසානායක මහතා ලබාගන්නේ ඡන්ද 351,244 කි. එසේම සජිත් ප්‍රෙමදාස සහ රනිල් වික්‍රමසිංහ යන අපේක්ෂකයන් දෙපළගේ ඡන්ද එකතුව වන 1,372,462 ක ප්‍රමාණය සජිත් ප්‍රේමදාස මහතා 2019 දී ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව ලබාගත් ඡන්ද ප්‍රමාණයට දළ වශයෙන් සමාන වේ (1,430,587). ඒ අනුව ජනාධිපතිවරණයේ දී උතුරේ බලපෑම් සහගත පිරිස්වල පළමු තෝරා ගැනීම වූයේ කුමක්දැයි පැහැදිලි වේ.

8. ජනාධිපතිවරණයේ දී බෙදුම්වාදීන්ගේ පළමු අපේක්ෂාව බිඳ දැමීමට රටේ බහුතර ජනතාව සමත්වීම නිසා ඩයස්පෝරාවට, ඉන්දියාවට මෙන්ම බෙදුම්වාදී දේශපාලන ව්‍යාපාරවලට දෙවන සැලසුම අනුව, එනම් අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා මගින් තම අරමුණ ඉටුකර ගැනීම සඳහා, නව උපාය මාර්ග තේරීමට සිදු වූ බව ඉතා පැහැදිලිය. ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණයේදී උතුර සහ නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක 5 සහ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ආණ්ඩුවේ පාර්ශ්ව ලබාගන්නා ඡන්ද ප්‍රමාණය 570,733 ක් හෙවත් ජනාධිපතිවරණයට වඩා ඡන්ද 219,489 කි. එම ප්‍රමාණය ආණ්ඩුවට තුනෙන් දෙකක පාර්ලිමේන්තු බලය ලබාදුන් 69 ලක්ෂයට ආසන්න ඡන්ද ප්‍රමාණයෙන් දළ වශයෙන් 7% ක් වැනි සුළු ප්‍රමාණයකි. (මෙම අංක ගණිතමය පැහැදිලි කිරීම මගින් උතුරේ පීඩිත ජනතාව රටේ ජනාධිපති ලෙස පත්වූ වාමාංශික නායකයා විසින් තමා දුකින් මුදවාගනු ඇතැයි එතුමාට ලබාදුන් ඡන්ද ප්‍රමාණය විශේෂයෙන්ම බෙදුම්වාදීන්ට ලබා නොදුන් ඡන්ද ප්‍රමාණය අවතක්සේරු නොවේ. )

9. ඊට අමතරව, බෙදුම්වාදී බලවේග විසින් රඟ දක්වන මානසික යුද උපක්‍රම නාටකයේ පිටපත නව ජනාධිපතිවරයාගේ පත්වීම් සමග වෙනස්කම්වලට භාජනය වී ඇති බව ද පිළිගැනීමට සිදුවේ. ඒ අනුව විවිධ නළුවන්ගේ භූමිකා වෙනස් වී ඇති බව පෙනේ. සුමන්තිරන් මන්ත්‍රීවරයා වෙනුවට අර්චුනා රාමනාදන් මන්ත්‍රීවරයා යොදාගනිමින් විහිළුකාරයකු මගින් ජනතාවට පිණිවිඩ ලබා දෙන ආකාරය දැක ගත හැකිය. සුමන්තිරන් මහතාගේ මුවින් පිට කළ නොහැකි ප්‍රභාකරන් දෙවියකු ලෙස පිළිගැනීම වැනි මතවාද විහිළුකාරයකු මගින් ලබාදීම වඩා ඵලදායී විය හැකිය. එසේ වුවත් එක් පැත්තකින් පළාත් සභා මැතිවරණය පවත්වා ජාතික ජන බලවේගයට ජයග්‍රහණය කළ හැකි බවට විශ්වාසය ගොඩ නගන අතර, එම මැතිවරණයේ දී සුමන්තිරන් මහතා වැනි ප්‍රබල බෙදුම්වාදී නායකයින් මහ ඇමැති අපේක්ෂකයා ලෙස ජයග්‍රහණය කරවීමේ උවමනාව කිසිසේත්ම බැහැර කළ නොහැකිය.

10. එම නාටකයේ තවත් සුවිශේෂී ජවනිකාවක් වන්නේ මීට පෙර ඩයස්පෝරාව විසින් භික්ෂූන් හත් නමක් යොදා ගනිමින් ඉදිරිපත් කළ 'හිමාලයා ප්‍රකාශය' නව වටයකින් මහා සංඝ රත්නය සහ ජනාධිපතිවරයා මත පැටවීම සඳහා යම් රාජ්‍ය නොවන සංවිධාන විසින් මෙහෙයුමක් දියත් කිරීමයි. (එම ප්‍රකාශය මගින් බෙදුම්වාදීන්ගේ ප්‍රධාන ඉල්ලීම වන යුද අපරාධ චෝදනා මත ආරක්ෂක හමුදා නිලධාරීන්ට දඬුවම් කිරීම සහ ඒ සඳහා ඊනියා සත්‍ය සෙවීමේ කොමිසම පිහිටුවීම මෙන්ම, 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම සහ ඉන්දු - ලංකා ගිවිසුමට ගරු කිරීම ආදී ඉල්ලීම් සඳහා මහා සංඝ රත්නයේ හා බහුතර සිංහල ජනතාවගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉතා සූක්ෂ්ම උත්සාහයක් ගනු ලැබේ.)

11. ඊට අමතරව බෙදුම්වාදී මාර්ග සිතියම ඔස්සේ ඉදිරියට ගමන් කිරීම සහ තම බලය තහවුරු කර ගැනීම සඳහා ඩයස්පෝරාව ප්‍රමුඛ බෙදුම්වාදී බලවේග විසින් ආණ්ඩුවට ඉදිරිපත් කරන සෙසු පූර්ව කොන්දේසි ඉටු කිරීම සඳහා ඉතා පැහැදිලි නම්‍යශීලීභාවයක් ආණඩුවේ ප්‍රකාශ සහ ක්‍රියාකලාපය

තුළින් පැහැදිලි වේ. එම කොන්දේසි අතුරින් පළමුවැන්න, මහවැලි අධිකාරී පනත අහෝසි කර උතුරු සහ නැගෙනහිර පළාත්වල රජයට අයත් භූමියෙන් 50% පමණ වන මහවැලි අධිකාරියට අයත් ඉඩම් පළාත් ඉඩම් බලතලවලට අනුව පරිහරණය නිරීම සඳහා නීතිමය තත්ත්වය නිර්මාණය කිරීමය. දෙවැන්න, ඉහත සඳහන් කළ ආකාරයට මේ වන විට ගැසට් කර ඇති සත්‍ය සෙවීමේ කොමිසම පනත කෙටුම්පත සම්මත කර රණවිරුවන්ට මානසික බාධක පැනවීම සහ ඍජු ජාත්‍යන්තර මැදිහත්වීමකට පාර කැපීමය. තුන්වැන්න, අභිචෝදක කාර්යාල පනත සම්මත කිරීම මගින් රණවිරු දඬයම් ක්‍රියාවලිය ආපසු හැරවිය නොහැකි ලෙස තවදුරටත් ඉදිරියට ගෙනයාමය. හතරවැන්න, උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල පුරාවිද්‍යා සිද්ධස්ථාන ගැසට් කිරීම වැළැක්වීම මගින් එම පළාත් පුරාවිද්‍යා අධිකාරී ප්‍රඥප්තිය යටතට ගෙන එම උරුමය විනාශ කිරීම සහ ඉඩම් කොල්ලකෑම සඳහා ඉඩ සැලසීමය. හතරවැන්න, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා වන නීති සංශෝධනය කිරීම මගින් ඩයස්පෝරාවේ කළුසල්ලි යොදාගනිමින් රටේ දේපළ අත්පත්කර ගැනීමට ඉඩ සලසා ගැනීමය. (2026.01.12 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩලයේ තීන්දුව මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත - 2006, ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ වැළැක්වීමේ පනත - 2005 සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත - 2006 යන පනත් ත්‍රිත්වය සංශෝධනය කිරීමට තීරණය කිරීම මගින් එම ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති බව පැහැදිලි වේ.)

12. ඊට අමතරව බෙදුම්වාදී මාර්ග සිතියම හුදෙකලාව ක්‍රියාත්මක නොවන බව ඉතා පැහැදිලිය. විශේෂයෙන්ම ප්‍රධාන සාධක තුනක් මගින් ආණ්ඩුවට ඇතිකරන බලපෑම මත බෙදුම්වාදීන්ට වාසිසහගත තත්ත්වයන් නිර්මාණය වීම බැහැර කළ නොහැකිය. ඒ අතරින් පළමු වැන්න, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ආණ්ඩුව තම න්‍යාය පත්‍රය තුළ සිරකර ගැනීම තුළ ආර්ථික අර්බුදයෙන් ගොඩවීම සඳහා ඵලදායී උපායමාර්ගික ප්‍රවේශයක් අනුගමනය කිරීමට නොහැකිවීම  නිසා අර්බුදයේ පීඩනය හේතු කොට ගෙන යටත්වීම සඳහා බලපෑම් එල්ල වීමය. (එහිදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසිවලට හිරවීම, BRICS සංවිධානය සහ ඊට අනුබද්ධ සංවර්ධන බැංකුව සමග එකඟතාවක් ඇති කර ගැනීමට නොහැකි වීම  සහ ඉන්දියානු සබඳතා ශක්තිමත් වීම මෙන්ම, චීන සබඳතා දුරස්වීම තුළ අර්බුදයෙන් ගොඩ ඒමේ මාවත තවදුරටත් දුෂ්කර විය හැකිය.) ඒ අනුව දෙවැන්න, ගිවිසුම් 7ක් අත්සන් කිරීම සහ ඒකාබද්ධ ප්‍රකාශයක් අත්සන් කිරීම මගින් ඉන්දියාව සමග ඇතිකරගත් එකඟතාව අනුව කටයුතු කිරීමට බලපෑම් එල්ල වීමය. එම එකඟතා අනුව ආර්ථික ඒකාබද්ධකරණ උපාංග 5ක් ක්‍රියාත්මක කර 'එට්කා' ගිවිසුම අත්සන් කළහොත් ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත්වීම වැළැක්විය නොහැකිය. තුන්වෙනුව, ඩොනල්ඩ් ට්‍රම්ප් ආගමනය සමග චීනය සමඟ ආරම්භ වීමට නියමිත භූ දේශපාලන ගැටුම තුළ ඉන්දු - පැසිෆික් කලාපයේ භූ දේශපාලන මර්මස්ථානය වන ශ්‍රී ලංකාවට ප්‍රබල බලපෑමක් එල්ල වේ. ඒ අනුව මේ වන විට ඇමෙරිකාව සමග අත්සන් කර ඇති මොන්ටානා ආරක්ෂක ගිවිසුමට පහසුකම් සැලසීම සඳහා SOFA ගිවිසුමට අදාළ 'බී' ඇමුණුමට එකඟතාව පළ කරමින් අමෙරිකන් හමුදාවලට සේවා සපයන දූපතක් හෙවත් ඉඩම් කැබැල්ලක් බවට ශ්‍රී ලංකාව පත්කර ගැනීමේ අනතුර ද බැහැර කළ නොහැකිය.

## නිර්දේශ හෙවත් ඉල්ලීම්:

1. 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් බලාත්මක කිරීම සඳහා එනම්, පොලිස් සහ ඉඩම්, ප්‍රඥප්ති මෙන්ම, විදේශ විනිමය ගනුදෙනු සිදුකළ හැකි ආකාරයට මහ ඇමැති අරමුදල් ප්‍රඥප්ති සහ පළාත් පුරාවිද්‍යා අධිකාරී ආදී ප්‍රඥප්ති සම්මත කිරීම මගින් ගැටුම් නිර්මාණය කිරීමට පළාත් සභාවලට ඉඩ ලබා නොදෙන බව ස්ථිරසාරව ප්‍රකාශ කිරීම. (එහිදී පොලිස්, ඉඩම් බලතල ලබා නොදෙන බවට ප්‍රකාශ කිරීම පමණක් සෑහෙන්නේ නැත. ඊට හේතුව එම බලතල දැනටමත් ව්‍යවස්ථාව මගින් ඉතා විස්තීර්ණව ලබා දී ඇති බැවින් අවශ්‍ය වන්නේ ආණ්ඩුකාරයාගේ ආශීර්වාදය, එනම් මහ ඇමතිවරයාට පක්ෂපාතී ආණ්ඩුකාරවරයකු පත් කිරීම පමණි.)

2. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවට ජන වර්ගය, ආගම, භාෂාව, කුලය හෝ ජීවත්වන ප්‍රදේශය අනුව වෙනස්කමත් සිදුනොවන බව සහතික කරන අතර, එතෙක් ඒ සඳහා නව අයිතිවාසිකම් පනතක් සම්මත කිරීම මගින් එම අවශ්‍යතාව ඉටු කිරීම සහ 1957 සමාජ දුබලතා වැළැක්වීමේ පනත බලාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම මගින් උතුරේ කුල පීඩනය සහ ඒ සමග බැඳුණු සමාජ, ආර්ථික සහ සංස්කෘතික පීඩනය අවසන් කිරීමට පදනම දැමීම මගින් උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාවගෙන් 65%ක් නියෝජනය කරන පීඩිත ජනතාවට සහන සැලසීම සහ ඒ මගින් එම ජනතාව බෙදුම්වාදී බලපෑම්වලින් මුදවා ගැනීම.

3. උතුරු සහ නැගෙනහිර පළාත්වල ජීවත්වන සුළුතර සිංහල ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අනාගතයේ දී 16 වැනි සංශෝධනය අහෝසි කරනතුරු සිංහල භාෂාව නිල භාෂාවක් ලෙස භාවිත කිරීම සඳහා ව්‍යවස්ථාවේ පවතින ප්‍රතිපාදනවලට අනුව අධිකරණ අමාත්‍යාංශයෙන් නියෝගයක් නිකුත් කිරීම. ඊට අමතරව, බහුතර දෙමළ ජනතාවට ලැබෙන අධ්‍යාපන පහසුකම් සිංහල දරුවන්ටත් ලැබෙන බව සහතික කිරීම සහ ආගමික ගැටුම් වැළැක්වීම සඳහා පුරාවිද්‍යා ආඥාපනත නිසි ලෙස බලාත්මක කිරීම මගින් බෞද්ධ, හින්දු සහ ඉස්ලාම් පූජා භූමි ඓතිහාසිකව පැවති ආකාරයට පවතින බව සහතික කිරීම. (විශේෂයෙන්ම " රාමායන මං පෙත" ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ රාම කෝවිල් 21ක් ඉදිකර ඒ මගින් ගැටුම් ඇවිලවීම සඳහා ගනු ලබන උත්සාහයට ඉඩ නොතැබීම.)

4. නව ව්‍යවස්ථාවක් මගින් බලය විමධ්‍යගත කිරීමේ දී (නව ව්‍යවස්ථාවක 13 වැනි සංශෝධනයක් නැත.) පාර්ලිමේන්තුවේ නීති හැදීමේ බලය බෙදී නොයන ආකාරයට, එහෙත් ප්‍රාදේශීය මට්ටමට උපරිම ලෙස විධායක බලතල ලැබෙන සහ ජන සභා මගින් මහජනයාට පාලනයට සහභාගී විය හැකි ව්‍යුහයක් හඳුන්වා දෙන බවට සහතිකයක් ලබාදීම. ඒ සඳහා මැතිවරණ වියදම් අඩු කර ගැනීම සහ කුඩා කොට්ඨාසයකට පත්වන පීඩිත ජනතාවගේ නියෝජිතයන්ට පළාත් සංවර්ධන සභාවක අමාත්‍ය ධුරයක් දැරිය හැකිවන තත්ත්වයක් නිර්මාණය කිරීම මුල්කරගෙන පළාත් සභා මැතිවරණය වෙනුවට පළාත් පාලන මැතිවරණයෙන් පත්වන නියෝජිතයන් අතුරින් ඔවුන්ගේ බහුතර කැමැත්ත මත පළාත් නියෝජිතයන් පත්කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම තුළින් පළාත් සංවර්ධන සභා පිහිටුවීම මගින් බෙදුම්වාදයෙන් රට ගලවාගන්නා අතර ජනතාවට පාලන බලතල ලබාදීම.

5. ක්ෂුද්‍ර මූල්‍ය පනත සංශෝධනය කිරීම මගින් ක්ෂුද්‍ර මූල්‍ය ණය පොළී අනුපාතය සාමාන්‍ය බැංකු පොලී අනුපාතයට ආසන්න අගයකට අඩු කිරීම සහ සැඟවුණු ගාස්තු අයකිරීම වැළැක්වීම මෙන්ම දිවි නැගුම බැංකු ජාලය, සමුපකාර බැංකු ජාලය සහ ගොවිජන බැංකු ජාලය යන රාජ්‍ය මූල්‍ය ආයතන පද්ධතියට රජය මගින් සහන පොළියට ගෙන ණය ලබාදීම මගින් විශේෂයෙන්ම උතුරේ බහුතරයක් වන පීඩිත ජනතාව ක්ෂුද්‍ර මූල්‍ය වහල් භාවයෙන් ගලවා ගැනීම.

6. ගොවි සමුපකාර ජාලයක් පිහිටුවීම සඳහා රජය මගින් සම්පත් යෙදවීම සහ ඒ මගින් විශේෂයෙන්ම උතුරේ කෘෂි නිෂ්පාදන වෙළෙඳපොළ කාර්යක්ෂම කිරීම මෙන්ම, සමුපකාර ගොවි සමිතිවලට (පෞද්ගලික අයිතිය නොමැතිව) රජය සතු ඌණ සංවර්ධිත ඉඩම් බදු පදනම යටතේ ලබාදීම මගින් ජනතාවගේ ආර්ථික ඉඩ ප්‍රස්ථා වර්ධනය කිරීම.

7. පුනරුත්ථාපනය වූ තරුණයන් ඇතුළු රැකියා විරහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම මගින් දේශීය සහ විදේශීය රැකියා අවස්ථා වර්ධනය කිරීම සඳහා රාජ්‍ය ආයතන

පද්ධතිය, ආරක්ෂක හමුදාව සතු සම්පත් සහ පෞද්ගලික අංශය යොදා ගනිමින් විශේෂ ව්‍යාපෘතියක් දියත් කිරීම සහ ඔවුන්ට විශ්ව විද්‍යාල උපාධි දක්වා අධ්‍යාපන අවස්ථා වර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමට විවෘත විශ්ව විද්‍යාල ජාලය පුළුල් කිරීම.

8. ආරක්ෂක හමුදා පිරිස් බලය අඩු කිරීම වෙනුවට එම පිරිස් බලය සිවිල් ඇඳුමින් යොදාගනිමින් උතුරු හා නැගෙනහිර පළාත්වලට විශේෂිත සංවර්ධන අධිකාරි දෙකක් පිහිටුවීම මගින් රාජ්‍ය සේවා සහ පොදු පහසුකම් වර්ධනය කිරීම. එසේම, එම ක්‍රියාවලිය තුළ උතුරේ සහ දකුණේ ජනතාවගේ ස්වේච්ඡා දායකත්වය ලබා ගැනීම සඳහා ඉඩ සැලසීම මගින් උතුර - දකුණ මානසික පාලම ඉදිකිරීම.

9. දැනට ගැසට් කර ඇති ඊනියා සත්‍ය සෙවීමේ කොමිසම පනත සම්මත නොකිරීම සහ අභිචෝදක කාර්යාල පනත ගැසට් නොකිරීම මගින් රණවිරුවන් දඩයම් කිරීමේ ක්‍රියාවලිය සහ විදේශීය මැදිහත් වීමට නීත්‍යනුකූලව ඉඩ සැලසීම ආදී බෙදුම්වාදී උවමනාවන් ඉටු කර ගැනීම සඳහා අටවා ඇති උගුලට පය නොතැබීම. එසේම 'හිමාලයා ප්‍රකාශය' මගින් දියත් කෙරෙන බෙදුම්වාදී මානසික යුද උපක්‍රමය තේරුම් ගෙන එම උගුලට පය නොතැබීම.

10. මහවැලි අධිකාරී පනත අහෝසි කිරීම මගින් රජයේ ඉඩම් නිදහස් කිරීම සඳහා ඉදිරිපත් වන ඉල්ලීම්වලට යටත් නොවීම සහ මුදල් විශුද්ධිකරණ පනත ප්‍රමුඛ අදාළ සෙසු පනත් සංශෝධනය කිරීම මගින් ඩයස්පෝරාවේ කළු සල්ලි යොදා ගනිමින් රටේ දේපළ අත්පත් කර ගැනීම සඳහා ගනු ලබන උත්සාහයන්ට යටත් නොවීම.

11. උතුරු සහ නැගෙනහිර පුරාවිද්‍යා සිද්ධස්ථාන විනාශ කිරීම වැළැක්වීම සඳහා හඳුනාගෙන ඇති ස්ථාන සියල්ල ආශ්‍රිතව මැනුම් කටයුතු සිදුකර ගැසට් කිරීම සඳහා කඩිනම් ව්‍යාපෘතියක් දියත් කිරීම සහ පුරාවිද්‍යා සිද්ධස්ථාන විනාශ කිරීම වැළැක්වීම සඳහා විශේෂ පොලිස් ඒකකයක් පිහිටුවීම. එසේම, පරිහානියට පත් වී ඇති දැනට පවතින පන්සල් ආශ්‍රිතව වැඩ වාසය කරන භික්ෂූන් වහන්සේලාගේ සුබසාධනය සහ එම ස්ථාන පුනරුත්ථාපනය කිරීම මෙන්ම, ඒවා ආශ්‍රිත බෞද්ධ දරු දැරියන්ගේ දහම් අධ්‍යාපන ආදී කටයුතු සඳහා සංස්කෘතික අරමුදල මගින් විශේෂ අරමුදල් ප්‍රමාණයක් වෙන් කිරීම.

12. ආරක්ෂක හමුදා සාමාජිකයන්ට එරෙහිව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම හරහා එල්ල කෙරෙන යුද අපරාධ චෝදනාවලට පිළිතුරු දීම සඳහා ස්වභාවික යුක්තිය මූල ධර්මය යටතේ අවස්ථාව ඉල්ලා සිටීම සහ ඒ සඳහා ජාතික බලවේග විසින් සකස්කර ඇති "විත්ති වාචකය" ලියවිල්ල මූලික ලියවිල්ලක් ලෙස යොදා ගැනීම (එම ලියවිල්ල පැමිණිලි විභාග කිරීමේ ක්‍රම වේදය යටතේ ජාත්‍යන්තර මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කර ඇත.) එසේම, ඩයස්පෝරාව සතුටු කිරීම හෝ ඔවුන්ගේ බලපෑම මත මේ වන විට ආරම්භ කර ඇති රණවිරු දඩයම් ක්‍රියාවලිය වහාම අත්හිටුවීම.

13. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1971 දී සම්මත කළ ඉන්දියානු සාගරය සාම කලාපයක් ලෙස නම් කිරීම සඳහා වූ 2832 යෝජනාව නැවත අනුමත කිරීම සඳහා සහ එම යෝජනාව අනුව පිහිටුවා ඇති ඉන්දියානු සාගර වළල්ල සංවිධානයේ සභාපතිකම ලබා ගැනීම සඳහා රාජතාන්ත්‍රික ක්‍රියාවලියක් ආරම්භ කිරීම මෙන්ම, ඒ මගින් ඉන්දියානු සහ ඇමරිකානු ආරක්ෂක ගිවිසුම් සහ සෙසු ගිවිසුම් මගින් ඇති කරන අයුතු බලපෑම්වලට මුහුණ දීම.

14. ඉන්දියානු ආරක්ෂක ගිවිසුම මෙන්ම, ඇමරිකානු මොන්ටානා ආරක්ෂක ගිවිසුම සහ ආපදා තත්ත්වය යොදා ගනිමින් රට තුළ හමුදාමය මැදිහත්වීම් සිදුකිරීමට ඉඩ ලබා නොදීම. ඉන්දියාව සමග ETCA ගිවිසුම අත්සන් කිරීමට හෝ ඇමරිකාව විසින් SOFA ගිවිසුමට අදාළව ඉදිරිපත් කරන ඇමුණුම 'බී' ලේඛනයට කිසිදු ලෙසකින් එකඟතාවයක් ලබානොදීම.

15. උතුරේ ජනතාවගේ ප්‍රධාන ආර්ථික ගැටලුවක් මෙන්ම මහා සම්පත් විනාශයක් ද වන ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රාකරුවන් විසින් ශ්‍රී ලංකාවේ සාගර සම්පත් කොල්ල කෑම පාලනය කර ශ්‍රී ලංකාවේ ධීවරයන්ගේ ආර්ථික ඉඩ ප්‍රස්ථා ආරක්ෂා කිරීම සඳහා නාවික හමුදාව මගින් උතුරු මුහුදේ මව් යාත්‍රා (Mother Ships) ස්ථානගත කොට ශ්‍රී ලංකාවේ ධීවරයන්ට සේවා සැපයීම, සාගර කලාපය ආවේක්ෂණය කිරීම සහ ආරක්ෂා කිරීම.

ස්තූතියි